# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2394/47 - 2024 ජූලි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2024.07.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KES/DS/LND/AC/8/5/23.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2019/HW/628.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 582බී, පැලැන්වත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පැලැන්වත්ත (කොට්ඨාස අංක 4 (පැලැන්වත්ත), කැස්බෑව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක. 521243, කලාප අංකය 03 හා පත්‍ර අංකය 1 හා 2024.04.02 දිනැති පිඹුරේ කැබලි අංක. 1 සිට 2 දක්වා පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0010 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (02):

01. කැබලි අංක **01**
ඉඩමේ නම: දෙල්ගහකනත්තවත්ත; ඉඩමේ විස්තරය: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: හඳරාගමගේ දොන් කුමාර ජයලාල්, අංක 15, මත්තේගොඩ පාර, පැලැන්වත්ත, පන්නිපිටිය, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0004.

02. කැබලි අංක **02**
ඉඩමේ නම: දෙල්ගහකනත්තවත්ත; ඉඩමේ විස්තරය: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: ශ්‍රියන්ත දයානන්ද සේනානායක, අංක 14, මත්තේගොඩ පාර, පැලැන්වත්ත, පන්නිපිටිය, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0006.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ


G 42311 - 17 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2024 අගෝස්තු මස 23 වැනි දින අනුව පෙ. ව. 10.00** ට කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, *2024 අගෝස්තු මස 16 වැනි* දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**කේ. පී. පේමදාස,**
ප්‍රාදේශීය ලේකම්,
කැස්බෑව.

2024 ජූලි මස 17 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0243

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: DSM/UK/LND/6/2/1-iiiවෙළුම:
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 13/96/D/244.

පහත උපලේඛන I යටතේ විස්තර දැක්වෙන ඉඩම් කොටස 7 වන ගජබා රෙජිමේන්තුවේ අවශ්‍යතාවයක් වෙනුවෙන් රජයට අත්කර ගැනීමට කටයුතු කර 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ දැන්වීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1072/11 හා 1999.03.26 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකිරීමට කටයුතු කර ඇත.

පසුව ඉහත ඉඩම් කොටස මා 1252 හා 2007.07.31 දිනැති සංශෝධිත පිඹුර මඟින් කැබලි අංක 37, 38, 39 සහ 40 ලෙස අනු බෙදීමට ලක්කර කැබලි අංක 39 සහ 40 දරන ඉඩම් කොටස් අවසතු කිරීමට කටයුතු කර තිබේ.

එබැවින්, ඉහත උපලේඛන I යටතේ විස්තර කර ඇති කැබලි අංක 1 දරන ඉඩම් කොටසින් පහත උපලේඛන II යටතේ විස්තර කර ඇති කැබලි අංක 37 දරන ඉඩම් ප්‍රමාණය සඳහා මින් ඉදිරියට අත්පත් කාර්යය සිදු කරනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

උපලේඛන I

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ මැදසිය පත්තුවේ, උකුවෙල ගමේ පිහිටි, මැනුම් අධිකාරිගේ අංක මා 1252 හා 1997.04.30 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස පෙන්වා ඇත. පහත විස්තර සඳහන් ඉඩම

**කැබලි අංක 01**
ඉඩමේ නම: උකුවෙලවත්ත; හිමිකම් කියන අය: රාජ්‍ය වැවිලි සංස්ථාව; ප්‍රමාණය: හෙක්ටයාර් 1.586.

උපලේඛන II

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ මැදසිය පත්තුවේ, උකුවෙල ගමේ පිහිටි, මැනුම් අධිකාරිගේ අංක මා 1252 හා 2007.07.31 දරන සංශෝධිත පිඹුරේ කැබලි අංක 37 ලෙස පෙන්වා ඇති පහත විස්තර සඳහන් ඉඩම

**කැබලි අංක 37**
ඉඩමේ නම: උකුවෙලවත්ත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 1.3765.

**එස්. එන්. කේ. සේරසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
උකුවෙල.

2024 ජූලි මස 22 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0248

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.